**කාර්මික තාක්ෂණ ආයතනය - 2023**
-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කාර්මික තාක්ෂණ ආයතනයේ ("ආයතනය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරන ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය අනුව වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත් ගෙවිය යුතු ශේෂ අතර පිළිවෙලින් රු.16,508,536 ක හා රු.9,956,010ක හර හා බැර ශේෂ දක්වා තිබුණි. | මෙම ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ගෙන යනු ලබන බව. | වත්කම් හා වගකීම් වල නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල පෙන්විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09 හි 35 ඡේදය අනුව ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමය (FIFO) හෝ භරිත සාමාන්‍ය ක්‍රමය (WAC) යන ක්‍රම දෙකෙන් එක් ක්‍රමයක් තෝරාගෙන භාණ්ඩ තොගයේ පිරිවැය අගය කළ යුතු වුවත් එසේ කටයුතු නොකොට සරල සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කර 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ තොගය රු.47,484,214 කට අගය කර ගිණුම්ගත කර තිබුණි. | පවතින පරිගණක පද්ධතිය තුල භරිත සාමාන්‍ය පිරිවැය අනුව තොග ආගණනය සිදු කිරීමට අවශ්‍ය පහසුකම් නොමැති බැවින් සරල සාමාන්‍ය ක්‍රමය තොග ආගණනය සඳහා යොදා ගෙන ඇත. මෙම පහසුකම ඇති නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව භාණ්ඩ තොගයේ පිරිවැය ගණනය කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිවය අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ණයහිමි ශේෂය රු.77,421,924 ක් | මූල්‍ය ප්‍රකාශන තුල ණයගැති ශේෂය ලෙස ලෙජරයේ සඳහන් ශේෂය | මූල්‍ය ප්‍රකාශනවල ණයගැති හා ණයහිමි |

| | | | |
|---|---|---|---|
| | විය යුතු වුවත් එම ණයහිමි ආයතන වලින් ලැබිය යුතු රු.16,562,135ක ශේෂ හිලව් කිරීමෙන් පසු ණයහිමි ශේෂය ලෙස රු.61,059,304 ක් දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් හා ණයගැතියන් රු.16,562,135 ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි. | රු.74,544,110 දක්වා ඇති අතර, එයින් අඩමාණ ණය වෙන්කිරීම සඳහා වසරක් ඉක්මවූ ණය ශේෂ සඳහා කරන ලද වෙන්කිරීම රු.50,748,008 අඩු කිරීමෙන් පසු ශුද්ධ අගය ලෙස රු.23,796,102 දක්වා ඇති බව. | ශේෂ නිවැරදිව දැක්විය යුතුය. |
| **(ආ)** | 2023 දෙසැම්බර් 31 දිනට පැවති හඳුනා නොගත් සෘජු බැංකු බැර කිරීම් රු.4,581,481ක් සමාලෝචිත වර්ෂයේදී ද හඳුනා ගැනීමට කටයුතු නොකර ගෙවිය යුතු වියදම් ලෙස ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම හඳුනානොගත් තැන්පතු අගය රු.4,581,481 ක් දක්වා අඩු කරගෙන ඇත. අදාල තැන්පතුකරුවන් හඳුනා ගැනීමට අවශ්‍ය සැසඳුම් අඛණ්ඩව සිදුකරමින් පවතින බව. ඉන්වොයිසි අංකයක් නොමැතිව බැංකු ගිණුමට මුදල් රැස්කිරීමට අවකාශ නොදීමට බැංකුව දැනුවත් කර ඇති බව. | හඳුනානොගත් සෘජු බැංකු බැර කිරීම් නිසි පරිදි හඳුනා ගැනීමට ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |
| **(ඇ)** | ආයතනයෙන් සේවාවන් සපයා ගැනීම සඳහා ගණුදෙනුකරුවන් විසින් මාර්ගගත ක්‍රමයට බැංකුවේ තැන්පත් කරන ලද මුදල් ද්විගණනය වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ණයගැති ශේෂය රු.4,844,388කින් අඩුවෙන් හා මුදල් ශේෂය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබූ අතර, එකී වටිනාකම නිෂ්කාශනය නොවූ තැන්පතු ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශනය තුළ ඇතුළත් කර තිබුණි. | මෙය පරිගණක මෘදුකාංග දෝෂයකි. ඉදිරියේදී එම තත්ත්ව වලක්වා ගැනීමට මාර්ගගත ක්‍රමයට සිදුකරන තැන්පතු උපලබ්ධි වූ දිනට ගිණුම්ගත කිරීමට උපදෙස් දී ඇති බව. | ද්විගණන දෝෂ වලක්වා ගෙන ගිණුම්කරණ කටයුතු නිසි පරිදි සිදු කිරීමට අවශ්‍ය පාලන ක්‍රමයක් පවත්වා ගත යුතුය. |
| **(ඈ)** | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගළපා තිබූ රු. 49,666,848 ක් වූ අඩමාණ ණය වෙන් කිරීම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදලින් නොවන ගණුදෙනු ලෙස වර්ෂයේ අතිරික්තයට ගැලපීම් කර නොතිබුණි. | අඩමාන ණය වෙන්කිරීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපීමට ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| **(ඉ)** | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදලට ගළපන ලද රු.9,676,185ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී මුදලින් නොවන ගණුදෙනු යටතේ මෙහෙයුම් අතිරික්තයට ගැලපීම් කර තිබුණි. | මෙය පරීක්ෂා කර බලා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉවත් කර සැකසීමට කටයුතු කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේදී ශුද්ධ කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් ගැලපීමේදී ජංගම වත්කම් හා ජංගම වගකීම් වල වෙනස්වීම් ගැලපිය යුතු වුවත්, ඒ යටතේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති ආයෝජන අඩුවීම් 40,000,000ක් ගලපා තිබුණි. | ජංගම නොවන ආයෝජන තුල ගැලපීම සිදුකර ඇත්තේ මෙම ආයෝජන මාස 03 ඉක්ම වූ ආයෝජන බැවිනි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (උ) | චීන ශ්‍රී ලංකා බයෝ තාක්ෂණ පර්යේෂණාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා දරන ලද සම්පූර්ණ වියදම වූ රු.40,711,887ක් මූල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ (working progress) යටතේ ඇතුලත් නොකර ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. | වැඩ නිමකළ ප්‍රමාණය වත්කම් / වියදම් ගිණුම් වලට මාරු කර ඉතිරි ප්‍රමාණය ශේෂයක් ලෙස ඉදිරියට රැගෙන ගොස් ඇති බව හා මෙය ව්‍යාපෘතියක් බැවින් ආයතනයේ කෙරීගෙන යන වැඩ තුල ඇතුලත් කර නොමැති බව. | නිවැරදි ආකාරයට වියදම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**1.5.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපි වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ණයගැති ශේෂය | 77,960,928 | 74,544,110 | 3,416,818 | වෙනසට හේතු සෙවීමට අවශ්‍ය සැසඳීම් සිදු කරමින් පවතින බව. | ණයගැති කාල විශ්ලේෂණයේ ණයගැති ශේෂය හා මූල්‍ය ප්‍රකාශනවල ශේෂය එකිනෙක සැසඳිය යුතුය. |
| (ආ) | පාරිතෝෂිත වෙන් කිරීම් | 14,288,849 | 15,258,114 | 969,295 | මෙය මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සිදු වූ යතුරු ලියන දෝෂයක් බව. | නිවැරදි වෙන්කිරීම් වටිනාකම් ඇතුලත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයු විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ශේෂ | 5,143,900 | සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට අවුරුදු 03 සිට 16 දක්වා කාල පරාසයක සිට ලැබිය යුතු ශේෂ 11 ක් සඳහා තහවුරු කරගැනීමට අදාළ තොරතුරු/ උපලේඛන | වසර 10 කට පෙර සිට පැවතෙන ශේෂයන් ඉදිරි වර්ෂ වලදී කපා හැරීමට කටයුතු කෙරෙන අතර ආපසු ගෙවිය හැකි ගුවන් ටිකට්පත් සඳහා මුදල් ඉදිරි ගුවන් ටිකට්පත් මිලදී ගැනීමකදී, හිලව් කරගැනීමට කටයුතු කළ හැකි බව අදාළ ආයතනය දැනුම් දී ඇති බව. | ලැබිය යුතු ශේෂ සඳහා විධිමත් තහවුරු කිරීම් සෑම වසරක් අවසානයේ දීම ලබාගැනීමට හැකිවන ලෙස තොරතුරු පවත්වාගෙන යා යුතුය. එම ශේෂ අයකර ගැනීමට විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුය. |
| (ආ) | බැංකු ගිණුම් අතර මුදල් මාරු කිරීම | 59,844,380 | මාරු කිරීමට අදාල විධිමත් අනුමැතීන් | අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව. | බැංකු ගිණුම් අතර මුදල් මාරු කිරීමේදී විධිමත් ලිඛිත අනුමැතියකින් සිදු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලැබිය යුතු ශේෂ තුළ වූ රු.94,691,793ක ශේෂ වසර 2ත් 17 ත් අතර කාලයක සිට පැවතෙන අතර එම ශේෂ තුල විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම් කොන්දේසි කඩකල නිළධාරින් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු.16,561,557 ක් විය. තව ද, 2022 වර්ෂයේ සිට රාජ්‍ය සංස්ථාවකින් ලැබිය යුතුව පැවති රු.11,415,309ක ශේෂයක් සඳහා මුළු අගයටම බොල්ණය වෙන් කිරීමක් සිදු කර තිබුණි. | වසර 10 කට පෙර සිට පැවතෙන ශේෂයන් ඉදිරි වර්ෂවලදී කපා හැරීමට කටයුතු කෙරෙමින් පවතින අතර විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම් කඩකල 17ක ගෙන් අයවිය යුතු රු.4,020,392 ක මුදල අයකර ගැනීම ව්‍යර්ථ වූයේ එම නිලධාරීන් දිවයින හැරගොස් සිටි බැවිනි. ඔවුන්ගේ බොහෝ ඇපකරුවන්ද, දිවයිනෙන් බැහැරව ගොස් සිටින අතර ඇතැමෙක් ජීවතුන් අතරද නැත .<br>රු.12,541,165 ක් වටිනා ගිවිසුම් කඩකළ නිලධාරීන් දෙදෙනෙකු සඳහා අවශ්‍ය කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව සමග මේ වන විටත් සිදු කෙරෙමින් පවතින බව. | ලැබිය යුතු ශේෂයන් හැකි ඉක්මනින් අයකර ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට අක්‍රීය පර්යේෂණ ව්‍යාපෘති 08ක එකතුව රු.8,768,889ක් වූ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම රඳවාගැනීම් ශේෂ අදාළ නිලධාරීන්ගේ තහවුරු කිරීම් මත නැවත ගෙවීමට හෝ ආදායමට ගැලපීමට අවශ්‍ය කටයුතු කරන බව. | අදාල ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(5) හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මිලදී ගැනීම් සඳහා ලබා දී තිබූ එකතුව රු.25,496,730ක් වූ 2018 සිට 2023 දක්වා ඉදිරියට ගෙන එමින් පැවති නිරවුල් නොකළ අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම අත්තිකාරම් මුදල් වලට අදාල වැඩ කඩිනමින් ඉටු කරමින් පවතින බව. | අදාල වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් නිරවුල් කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 756 | 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 භාණ්ඩ සමීක්ෂණය මේ වනවිට සිදුකරමින් පවතින බව. | නියමිත දිනට සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය |
| (iii) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදෙන ලද රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාල කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණිත දිනය වූ 2024 ජුනි 03 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉතා කඩිනමින් විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |

### 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අක්‍රීය බැංකු ගිණුම් 3ක රු.2,443,512 ක ශේෂයක් පැවතියද එම ශේෂය වසර 07 කට අධික කාලයක සිට උපයෝජනය කිරීමට හෝ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | විවිධ කාර්යයන් සඳහා ආරම්භ කල මෙම ගිණුම් වල මුදල් ඉදිරියේදී ආයතනයට පවරා ගැනීමට කටයුතු කරන බව. | අක්‍රීය බැංකු ගිණුම් ශේෂ උපයෝජනය කිරීමට හෝ ආයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.92,240,946 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.27,510,988 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.64,729,958ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ බොල් ණය වෙන් කිරීම රු.61,774,962කින් හා ගිවිසුම්ගත සේවා වියදම රු.37,495,718කින් වැඩි වුවද ප්‍රමිති සේවා ආදායම රු.71,669,307කින් හා පුනරාවර්ථන ප්‍රදාන රු.100,000,000කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 සිට 2022 දක්වා කාලය තුල වටිනාකම රු.85,738,759 ක මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වැයකරමින් නිම කරන ලද පර්යේෂණ 59 ක් අතරින්, රු.28,625,249 ක් වූ පර්යේෂණ 18 කට අදාලව තාක්ෂණයන් 56 ක් සංවර්ධනය කර තිබුණි. එසේ වුවද ඉන් පර්යේෂණ 04 කට අයත් තාක්ෂණ පැවරීම් 6ක් පමණක් සිදුකර තිබුණි. රු.27,039,217 ක් වැය කරන ලද පර්යේෂණ 14 කට අදාලව වර්ෂ 01 සිට 03 දක්වා කාලයක් ගතකරමින් සංවර්ධනය කර තිබු තාක්ෂණයන් 50ක් විගණන අවස්ථාව වන විටත් පැවරීම් කර නොතිබීමෙන් එම තාක්ෂණයන් යල් පැනීම් සහ ඵලදායි භාවිතයෙන් ලබාගත හැකි ආර්ථික වාසි රටට අහිමි වීම් සිදුව තිබුණි. එමෙන්ම පර්යේෂණ මඟින් සොයාගත් විසඳුම් ආහාර ,සෞඛ්‍ය, පරිසර වැනි විවිධ ක්ෂේත්‍රවල හඳුනාගත් ගැටලු නිවැරදි කිරීමට යොමු නොවීම මත අවම භාවිතයකට ලක්වීමක් සිදුව නොතිබුණි. | තාක්ෂණ හුවමාරු ක්‍රමවේදය තවදුරටත් ශක්තිමත් කර වැඩි තාක්ෂණ හුවමාරු ප්‍රමාණයක් සිදු කිරීමේ අදහසින් ITI Business Center (ITI ව්‍යාපාරික මධස්ථානය) මෑතකදී ස්ථාපනය කරන ලද බව. | නිමකරන ලද පර්යේෂණ වල තාක්ෂණ සොයාගැනීම් නිසි පරිදි සංවර්ධනය කල යුතු අතර නව තාක්ෂණයන් රටේ සුභ සිද්ධිය සඳහා යොදා ගැනිමට හැකිවන පරිදි තාක්ෂණ පැවරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | ආයතනයේ පර්යේෂණ කණ්ඩායම් පර්යේෂණ දීමනා ලෙස 2020, 2021 හා 2022 වර්ෂවල රු.59,915,608ක් ගෙවීම් ලබා තිබුණද ආයතනය පිහිටුවීමේ මූලික අරමුණ වන ශ්‍රී ලංකාවේ තාක්ෂණ මට්ටම උසස් කිරීම සඳහා නිෂ්පාදන වල තත්ත්වය, කර්මාන්ත වලදී භාවිතා කරන තාක්ෂණ ක්‍රියාවලි හා ක්‍රම වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත වලදී භාවිතය සඳහා අලුත් ක්‍රියාවලි හා ක්‍රමෝපායන් සොයා ගැනීම පිණිස පර්යේෂණ සිදුකිරීම යන අංශ සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලබාදී නොතිබුණි. | වර්තමානය වනවිට මෙය පූර්ණ ලෙස රජයෙන් යැපෙන ආයතනයක් නොවන අතර කර්මාන්ත වල අවශ්‍යතා අනුව පර්යේෂණ හා සංවර්ධන කාර්ය සිදුකරනු ලබන බව. | පර්යේෂණ දීමනා ගෙවීමේදී තාක්ෂණ සොයාගැනීම් වල ඵලදායීතාවය හා සාර්ථකත්වය ඇගයීමට ලක් කළ යුතුය. |
| **(ඇ)** | 2003-2013 අතර කාල පරාසය අතරතුර මිලදී ගෙන තිබූ එකතු වටිනාකම රු.9,943,423ක් වූ රසායනාගාර උපකරණ අභාවිතව පැවතුනද ඒවා නිසි පරිදි අලුත් වැඩියා කිරීමට හෝ අලෙවි කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම උපකරණ අලුත්වැඩියා කිරීම අවාසිදායක බැවින් අපහරණය සඳහා කටයුතු කරන බව. | භාවිතා නොකරන රසායනාගාර උපකරණ නිසි පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | CML (Chemical & Microbiological Laboratory) අංශයට අදාල රු.2,367,736ක යන්ත්‍ර පිරියත හා රසායනාගාර උපකරණ, පරිගණක හා පරිගණක උපකරණ, ලී බඩු හා කාර්යාල උපකරණ 2022 වර්ෂයේ සිට භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. | මෙම උපකරණ ක්‍රමාංකනය කර 2023 වසරේදී වත්කම් ලෙස හඳුනාගෙන ඇති බව. | වත්කම් සියල්ල වාර්ෂිකව, භෞතිකව සත්‍යාපනය කළ යුතුය. |
| **(ඉ)** | ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාරය විසින් ඉකුත් වසර 05ක කාලය තුළ රු.9,020,103 ක භාණ්ඩාගාර ප්‍රදාන භාවිතා කර සිදුකර තිබූ පර්යේෂණ ව්‍යාපෘති 05ක් තුළින් සොයාගෙන තිබූ නව තාක්ෂණයන් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් පැවරීමෙන් තොරව අභාවිතව පැවතුණි. 2018 වර්ෂයේ සිදු කරන ලද රබර් සහ මිනිරන් භාවිතයන් නැනෝ සංයුතියේ තාප සන්නායකතාවය වැඩි දියුණු කිරීම, වාහන වලින් පිට වන වායු විමෝචනය අඩු කිරීම සඳහා නැනෝ අංශු ආධාරක යොදා ගැනීම පිළිබඳ පර්යේෂණය, පරිසරයට අහිතකර | යම් වසරක නිපදවන ලද තාක්ෂණ ක්‍රම එම වසර තුලම හුවමාරු කළහැකි නොවුවත් ඉදිරි වසර වලදී ද තාක්ෂණ හුවමාරු සිදු කල හැකි බව. | පර්යේෂණ තුලින් සොයාගන්නා නව තාක්ෂණය රටේ සුභසිද්ධිය සඳහා භාවිතයට ගැනීමේ පාර්ශවයන් සොයාගැනීමේ වැඩපිළිවෙලක් හඳුන්වාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පොලිතීන් වෙනුවට යොදා ගත හැකි පරිසර හිතකාමී පොලිතීන් හා කෑම කොල නිෂ්පාදනයකට සුදුසු තාක්ෂණයක් සොයා ගැනීම වැනි පර්යේෂණයන් සිදු කර තිබුණ ද, තාක්ෂණය භාවිතයට යොදා ගැනීමේ පාර්ශව හඳුනා ගෙන නොතිබුණි. දේශීය සම්පත් සඳහා අගය එකතු කිරීමේ තාක්ෂණය තුළින් ඒවායේ කාර්යක්ෂම භාවිතය ඉහළ නැංවීමේ ප්‍රතිලාභයද, දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට යොදා ගැනීමේ අවස්ථාව ද මග හැරී තිබුණි. | | |
| (ඊ) | නව තාක්ෂණයන් පැවරීම සඳහා කර්මාන්තකරුවන් සොයා ගැනීමට වඩාත් ශක්තිමත් අලෙවිකරණ වැඩ පිළිවෙළක් යොදා නොගැනීමෙන් තාක්ෂණ පැවරීම් ප්‍රමාද වීම මත ආයතනයේ ආදායම් ඉපයීමේ හැකියාව සීමා වී තිබුණි. | ITI Business Center (ITI ව්‍යාපාරික මධ්‍යස්ථානය) හරහා ශක්තිමත් වෙළඳපොලක් හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | පර්යේෂණ තුලින් සොයාගන්නා නව තාක්ෂණය රටේ සුභසිද්ධිය සඳහා භාවිතයට ගැනීමේ පාර්ශවයන් සොයාගැනීමේ වැඩපිළිවෙලක් හඳුන්වාදිය යුතුය. |
| (උ) | ආයතනය සතුව තාක්ෂණයන් 486ක් පමණ පැවතිය ද, එවැනි තාක්ෂණයන් භෞතිකව ලේඛනගත කර හෝ නිශ්චිතව සුරක්ෂිතාගාරයක මෘදුකාංග ලෙස හෝ සංරක්ෂණය කර නොතිබුණි. මේ හේතුවෙන් පර්යේෂණ සිදුකළ පර්යේෂකයින් ආයතනයෙන් ඉවත්වීම, විශ්‍රාම යාම, මියයාම, වෙනත් ආයතනයකට යාම, විදේශගතවීම වැනි සිද්ධීන් මත එකී තාක්ෂණයන්ද ආයතනයට අහිමිවීමේ අවදානමක් පැවතුණි. | තාක්ෂණ දත්ත (තාක්ෂණ පිරිවිතර දත්ත) ගබඩා කිරීමට තාක්ෂණ බැංකුවක් පවත්වා ගෙනයාම ඉතා කාලෝචිත වන බව. | තාක්ෂණ සොයා ගැනීම් නිසි පරිදි සංරක්ෂණය කල යුතු අතර නව තාක්ෂණය රටේ සුභ සිද්ධිය සඳහා යොදා ගැනීමට හැකි වන පරිදි තාක්ෂණ පැවරීමට අවශ්‍ය කාර්යක්ෂම ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඌ) | සංවර්ධිත රටවල උසස් ඖෂධ රසායනාගාරවලට සමගාමීව පහසුකම් සහිතව ජීඑල්පී(GLP) තත්ත්වය ඇතුළුව ප්‍රතීතනය ලත් අති නවීන ඖෂධ රසායනාගාරයක් භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් රු.99,423,972ක වියදම් දරා ආයතනය තුල 2019 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබූ අතර, දිවයිනේ ඇති රෝහල් පද්ධතිය ද ඇතුලත්ව සියළුම බටහිර ඖෂධ සපයාගැනීම හා බෙදා හැරීම් | දේශීයව නිෂ්පාදනය කරන සමාගම් විසින් ආනයනය කරනු ලබන ඖෂධ නිෂ්පාදන පරීක්ෂා කිරීම විධිමත් කිරීම සඳහා රජයේ මහපෙන්වීම සහ මූල්‍ය අනුග්‍රහය මත පදනම්ව රසායනාගාරය ආරම්භ කරන ලදී. ජාතික ඖෂධ නියාමන අධිකාරිය මූලික ලියාපදිංචිය සහ පසුව වාර්ෂික ලියාපදිංචිය සඳහා ඖෂධ නිෂ්පාදන වල ගුණාත්මකභාවය පිළිබඳ තුන්වන පාර්ශවයක, ස්වාධීන | මෙවැනි විශාල ප්‍රාග්ධන වියදම් සහිත ව්‍යාපෘති ආරම්භ කිරීම නිසි ශක්‍යතා අධ්‍යයන හා සැලසුම් මත සිදුකළ යුතුය. මෙකී රසායනාගාරය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කිරීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය මඟින් උක්ත රසායනාගාරයෙන් සේවාවන් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම නිසා රසායනාගාරය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූ ශ්‍රී ලංකාව තුල ඖෂධ අංශයේ සංවර්ධනය සඳහා ස්වාධීන ප්‍රතීතනය ලත් තෙවන පාර්ශවීය පරීක්ෂණාගාරයක් ලෙස මෙම රසායනාගාරය භාවිතා වී නොතිබුණි. | පරීක්ෂණ අනිවාර්ය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කරනු ඇතැයි අපේක්ෂා කලද තෙවන පාර්ශවිය පරීක්ෂණය ඖෂධ නියාමන අධිකාරිය විසින් අනිවාර්ය කර නොමැති බැවින් ඖෂධ නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් ආයතනය වෙත නොපැමිණෙන බව. | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අගෝස්තු 31 දිනැති අංක අමප/16/1576/19/96 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකාවේ මහජන උපයෝගීතා කොමිසමේ නියමයන්ට අනුකූලව තුන්වන පාර්ශවීය ඛනිජ තෙල් නිෂ්පාදනයේ පරීක්ෂාවන් සිදු කිරිම පිණිස උපකරණ අත්පත් කරගැනීමට හා සවිකිරීමට රු.මිලියන 117.7ක් වැය කර ස්ථාපනය කර තිබූ ඛනිජ තෙල් හා ලිහිසි තෙල් රසායනාගාරය සඳහා ඛනිජ තෙල් සාම්පල් යැවීමේ ක්‍රමවේදයක් නිර්මාණය වී නොතිබීම නිසා රසායනාගාරය පිහිටුවීමේ මූලික කර්තව්‍යය ඉටුව නොතිබුණි. වර්තමානයේ රටට ආනයනය කරන ඛනිජ තෙල්වල තත්ත්වය සම්බන්ධයෙන් ගැටළු පවතින බවට මහජන මතයක් රට තුළ පවතිද්දී එම කටයුත්ත සඳහම ස්ථාපිත රසායනාගාරයෙන් එම කටයුත්ත ඉටු වී නොතිබුණි. | මෙම ඛනිජ තෙල් රසායනාගාරය සඳහා නියාමන අධිකාරි බලයක් නොමැති බැවින් සියළුම සාම්පල අප රසායනාගාරයට නොලැබේ. මෙම ක්‍රියාවලිය ජාතික අවශ්‍යතාවයක් වන බැවින් ඒ සඳහා බලශක්ති අමාත්‍යාංශය සහ උපයෝගීතා කොමිෂන් සභාවේ පූර්ණ කැපවීම මත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි හැකි ඉක්මනින් ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු සිදුකරමින් පවතින බව. | ඛණිජ තෙල් සාම්පල ලබා ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කල යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්තමානයේ ඖෂධ වලට අදාළ පරීක්ෂණ සේවාවන් සැපයීම සඳහා ආයතනයට අත්‍යවශ්‍ය වන මාලඹේ පිහිටි ඖෂධ තාක්ෂණ අංශය (Malabe Herbal Technology | Pilot Freeze Dryer හා GR Microwave System යන්ත්‍රයේ කොටසක් අලුත්වැඩියා කිරීමට ප්‍රසම්පාදන අංශය මඟින් සිදු කරමින් පවතී. අනෙකුත් සියලු වත්කම් | අලුත්වැඩියාවන් සිදු කර යන්ත්‍රෝපකරණ ක්‍රියාකාරී තත්ත්වයට පත් කර භාවිතයට ගත යුතුය. |

| | | |
|---|---|---|
| Section) තුල ඇති රු.2,202,614ක් වටිනා යන්ත්‍රෝපකරණ 04 ක් අක්‍රීයව පැවැති අතර විගණිත දිනය වූ 2024 මැයි 31 වන විටත් එම යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආයතනයේ අනුමත කාර්යමණ්ඩලය 439 ක් වුවද තත්‍ය කාර්යමණ්ඩලය 286 ක් වීමෙන් තනතුරු 44 කට අදාළව පුරප්පාඩු 153 ක් පැවතුණි. | බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය හේතුවෙන් බඳවාගැනීම් සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම අපහසු අතර මේ වනවිට ක්‍රමිකව බඳවා ගැනීම් සිදුකරමින් පවතින බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |